## 2021 නොවැම්බර් 07 වන දින පවත්වන්නට යෙදිනි.

රටේ පැවති කොරෝනා තත්ත්වය හමුවේ, එවකට පැවති නීතියට අනුකූලව සෞඛ්‍යාරක්ෂිතව ඉතා සුළු සාමාජිකයින් පිරිසකගේ සහභාගීත්වයෙන් මෙත් සවිය වාර්ෂික මහ සභාව ඉතා චාම් අයුරින් පවත්වන්නට යෙදිනි.














## වෙසක් පොහොය නිමිති කොටගෙන 2022.05.16 දින ධම්ගවේශි බෞද්ධ ආශ්‍රමයේ දී පැවත් වූ අනේවාසික භාවනා වැඩසටහන







## මෙත් සවිය කමිටු ක්‍රියාකාරකම්



2022/03/14 දින අසරණ සරණ කමිටුව විසින්
හොරොව්පතාන සිසුවෙකුට
අංගසම්පූර්ණ පරිගණකයක් පරිත්‍යාග කිරීම.



මෙත් සවිය TV මාධ්‍ය ජාලය සඳහා රු 145,000 ක් වටිනා
ඉතා අත්‍යවශ්‍යව තිබූ LED විදුලි අලෝක පද්ධතියක්
උපසභාපති චින්තක බණ්ඩාර මහතා විසින්
මෙත් සවියට ප්‍රදානය කරන අවස්ථාව.



මෙත් සවිය ස්වයංපෝෂණ වැඩසටහනෙහි
නිපදවන ලද ජීවවායුජනක පද්ධතියක්

# මෙත් සවිය

## මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය

2022 ජූනි 9 දින
ලංකාදීප පත්‍රයේ
සම්පූර්ණ පිටුවක පළවූ
ස්වයංපෝෂණ
දැන්වීම් අතිරේකය

## ලංකාද්වීපය වත්මන් දුකින් ගොඩගෙන ලොව ශ්‍රේෂ්ඨතම රටක් බවට පත්කිරීම සඳහා පුරවැසියකු වශයෙන් ඔබට තනි තනිවද දියහැකි සහයෝගය ලබාදෙන ලෙස

මෙත්සවිය නිර්මාතෘ මහාචාර්ය චන්දන ජයරත්න ඇතුළු මෙත්සවිය සාමාජිකයින් ලක්වැසි ජනතාවගෙන්
මෙත්සිත් පෙරදැරිව ඉල්ලා සිටියි !!

පුරවැසි ඔබගේ සහයෝගය ලබාදුනහොත් තිරසර විසඳුමක් දෙමින් රට ගොඩගැනීමේ කර්තව්‍යට සහය දීමට අප ඇපකැප වෙන්නෙමු.

මේ අවස්ථාවේදී ක්ෂණික විසඳුමක් වශයෙන් රට රටවලින් ණය ලබා ගත්තද, පවතින ණය බරට අමතරව එම අලුත් ණය ද පසුව ගෙවන්නට වන නිසා රට තුළ විදේශ මුදල් සංචිත ඉතිරි කර ගැනීමේ තිරසර වැඩපිළිවෙළක් දියත් නොකළහොත් අනාගතයේ ද රටේ තත්ත්වය ඉතා බරපතළ වනු ඇත. මේ සඳහා තම වගකීම් ඉටු කරන පුරවැසියකු වශයෙන් මෙත්සවිය ස්වයංපෝෂණ වැඩපිළිවෙලට ඔබගේ දායකත්වය ලබා දෙන්න.

**www.swayanposhana.lk**

මෙත්සවිය යනු පුරා වසර 18 කට අධික කාලයක් සමථ විදර්ශනා භාවනාව සහ චිත්ත සංයම අභ්‍යාස උගන්වමින් සාමාජිකයින්ගේ ආධ්‍යාත්මික ශක්තිය වැඩි දියුණු කරලීම සඳහා (වත්මන් සාමාජිකත්වය 7000 කි) වැඩසටහන් කරගෙන යනු ලබන පුණ්‍ය සංසදයකි. මීට අමතරව බුදුරජාණන් වහන්සේගේ ප්‍රථම ලංකාගමනය සිදුවූ මහියංගණය පුද බිමෙහි උස බුදු පිළිමයක් නැති අඩුව සපුරමින් මේ වන විට අවසන් අදියරෙහි ඉදිකෙරෙමින් පවතින ලක්දිව උසම වටකුරු බුදු පිළිමය තැනීම, නාගදීප විහාරස්ථානයේ බැතිමතුන් සඳහා වන වැසිකිළි පද්ධතිය තැනීම, නොමිලේ උගන්වන පෙරපාසැල්, පුණ්‍යාධාර සැපයීම් ඇතුළු විවිධ පුණ්‍යකර්ම රාශියක නිරත වේ. (විස්තර www.methsaviya.lk). මෙම කටයුතු කරනුයේ කිසිදු විදේශ ආධාරයකින් තොරව මෙත්සවිය සාමාජිකයින්ගේ බැතිබර දායකත්වයෙනි. මෙත් සවිය නිර්මාර්තෘ මහාචාර්ය චන්දන ජයරත්න මහතාගේ උපදෙස් මත ලංකාද්වීපයේ වර්තමානයෙහි මතුවී ඇති දුක්ඛිත තත්ත්වයෙන් රටත් ජනතාවත් බේරාගැනීම සඳහා සහයෝගය දීමට මෙම වැඩපිළිවෙළ දියත් කර ඇත. එහි පළමු අදියර ලෙස තිරසර විසඳුමක් වශයෙන් විදේශ මුදල් සංචිත රට තුළ ඉතුරු කර ගැනීම සඳහා විකල්ප ක්‍රමවේද රට තුළම වර්ධනය කිරීමට මුල්තැන දෙනු ලැබේ.

**රට ගොඩ ගැනීම සඳහා රජයට පමණක් භාරදී බලා නොසිට පුරවැසියකු වශයෙන් තම වගකීම් ඉටු කරන්න. සෑම දෙයින්ම ස්වයංපෝෂිත වූ රටක් තමන් වෙනුවෙන් සහ අනාගත දරුවන් වෙනුවෙන් ඉතිරි කිරීමට ඔබ සියලු දෙනාගේම දායකත්වය අත්‍යවශ්‍ය වේ.**

**මේ සඳහා පහත අයුරින් දායක වන්න.**

### වාහන වලට යොදන ඉන්ධන සඳහා යන විදෙස් මුදල් ඉතිරි කර ගැනීම පිණිස විකල්ප ඉන්ධන යොදා ගැනීම/පර්යේෂණ සඳහා ආධාර කිරීම

තායිලන්තය වැනි රටවල් පෙට්‍රල් සමග මිශ්‍ර කිරීමට මඤ්ඤොක්කා වලින් තනන එතනෝල් යොදා ගනියි. මේ අතර දකුණු ඇමරිකානු රට වල ඩීසල් වෙනුවට ගසකින් එන Biodiesel යොදා ගනියි. එළවළු තෙල් ආදියෙන් නිපදවනු ලබන Biofuel වර්ග ද සමහර රටවල ප්‍රසිද්ධියට පත්ව තිබේ. මේ සඳහා වන පර්යේෂණ කිරීම සඳහා මෙත්සවිය මගින් ආධාර ලබාදීමට ද බලාපොරොත්තු වේ.

### පිටරටින් ගෙනෙන LP ගෑස් වෙනුවට ආහාර පිසීම සඳහා ජීව වායුව හඳුන්වාදීම

දැලිකුණු නොමැති බැවින් අද ගම්බද පවා ආහාර පිසීම සඳහා ගෑස් භාවිත කළ ද ඒ සඳහා යන විදෙස් මුදල් ඉතුරු කර ගැනීම පිණිස නිවසේදීම අපද්‍රව්‍ය යොදා ජීව වායුව යොදා කෑම පිසීම සඳහා උපකරණ සහ ක්‍රම හඳුන්වාදීම සහ එම පර්යේෂණ වලට ආධාර කිරීම. විකල්ප ලිප්ද හඳුනුවා දීම

### සෑම නිවසකම ආහාරයට ගතහැකි පැළයක්වත් රෝපණය කර වගා සංග්‍රාමයක් ආරම්භ කිරීමට නොමිලේ බීජ ලබාදීම

ඉදිරියේදී ආහාර හිඟයක් රට තුළ ඇති වූ විට විදේශ වලින් ආහාර ගෙන්වීම සඳහා වැය වන විදෙස් මුදල් ඉතිරි කර ගැනීම පිණිස සියලු දෙනා



විසින්ම වගා සංග්‍රාමයක් ඇරඹිය යුතුය. අල බතල මඤ්ඤොක්කා ආදී ඉක්මනින් ඵල නෙළාගත හැකි ආහාර වගා කිරීමට සෑම පුරවැසියෙකුම උනන්දු විය යුතුය. මේ සඳහා අවශ්‍ය බීජ සහ පැළ ලබාදීම මෙත්සවිය මගින් රටපුරා පිහිටි අප සාමාජිකයන් හරහා ඉල්ලීමක් ලද විට ඉටු කරනු ඇත. තවද මෙහිදී සියලුම නගරාශ්‍රිත තට්ටු නිවාස වල වගා කළ හැකි විවිධ ක්‍රමවේද අපගේ www.swayanposhana.lk වෙබ් අඩවියේ සඳහන් කර ඇති අතර අවශ්‍ය උපදෙස් ලබාදේ. සෑම නිවසකම අවම බට්ටු පැළයක් වත් වවා ගැනීම සඳහා පුරවැසියා වගකීම් දැරිය යුතු වන්නේය.



**විදේශ මුදල් වැයවන පාන්පිටි ආනයනය වෙනුවට විකල්පයක්/එම පර්යේෂණ සඳහා ආධාර කිරීම**

විදේශ මුදල් වැයවන පාන්පිටි ගෙන්වීම වෙනුවට විකල්පයක් ලෙස හාල් පිටි සහ මඤ්ඤොක්කා පිටි යොදා ගැනීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ඉල්ලීම් මත පවත්වනු ලැබේ. දකුණු අප්‍රිකාව තුළ සමහර රටවල මෙම ක්‍රියාවලිය දැනටමත් සිදුවේ.



**කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අවශ්‍ය වන පොහොර වලින් ස්වල්පයක්වත් නිවස තුළම නිෂ්පාදනය කිරීම**

කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා අවශ්‍ය වන පොහොර වලින් ස්වල්පයක්වත් නිවස තුළම නිෂ්පාදනය සඳහා කරනු ලබන ක්‍රමවේද හඳුන්වා දෙනු ලැබේ. දැනට වෙළෙඳ පොලෙහි පවතින දේශීය නිෂ්පාදන සඳහා www.swayanposhana.lk වෙබ් අඩවිය බලන්න. ජීව වායුව නිපදවීමේදී ද අතුරුඵලයක් ලෙස පොහොර ලැබේ.



**සූර්ය බලය ඇතුළු විකල්ප බල ශක්තීන්ගෙන් ගෘහ විදුලිය නිපදවා ඉන්ධන පිටරටින් ගෙන්වීම සඳහා වැයවන විදෙස් සංචිත අවම කරගැනීම**

ගෘහ විදුලිය නිපදවීමේදී ඉන්ධන පිටරටින් ගෙන්වීම සඳහා වැයවන විදෙස් සංචිත අවම කරගැනීම පිණිස සූර්ය බලය ඇතුළු විකල්ප බල ශක්තීන් යොදාගැනීමට දිරිමත් කරන අතර ඒ සඳහා ඔබට උපදෙස් ලබාදීම. සූර්ය පැනල පද්ධති ගතහැකි ස්ථාන www.swayanposhana.lk වෙබ් අඩවියේ සඳහන් කර ඇත. අවශ්‍ය උදවු ලබා දෙන්නෙමු. රාත්‍රිය පහන් වන තෙක් දැල්වෙන සූර්ය බලයෙන් ක්‍රියාකරන එළිමහන් විදුලි ආලෝක කුලුනු ගත හැකි ස්ථාන ද වෙබ් අඩවියේ සඳහන් වේ. **මෙම කාලය තුළ සෑම නිවසකම අවම වශයෙන් විදුලි බල්බ දෙකක්වත් නිවාදැමීමට උත්සුක වන්න.**



**විදෙස්වල සිටින ඥාතීන් හරහා ඔබට හෝ ඔබ පවුලට ඩොලර් 100 ක මුදලක් බැංකුවක් හරහා ගෙන්වා ගන්න**

බෙහෙත් ද්‍රව්‍ය ඇතුළු අත්‍යවශ්‍ය භාණ්ඩ ගෙන්වීම සඳහා කුමන හෝ රජයක් විසින් ගනු ලබන ප්‍රයත්නයට වක්‍රාකාරයෙන් හෝ සහයෝගය දැක්වීම පිණිස ඔබගේ පිටරටවල සිටින සියලු ඥාතීන්ගෙන් ඔබගේ නිවසට හෝ ඔබට ඩොලර් 500 ක මුදලක් හෝ අවම ඩොලර් 100 ක මුදලක්වත් බැංකුවක් හරහා එවන ලෙස ඉල්ලා සිටින්න. මේ අවස්ථාවේදී ක්ෂණිකව රටෙහි ඇති මුදල් අවශ්‍යතාවය එමගින් යම් ප්‍රමාණයකට හෝ පිරිමැසෙනු ඇත.

**අර්බුද කාලය අවසන් වන තෙක් වත් අත්‍යවශ්‍ය නොවන විදෙස් භාණ්ඩ මිලදී ගැනීමෙන් හැකිතරම් වළකින්න. හැකි සෑම විටකදීම දේශීය නිෂ්පාදන වෙත යොමුවන්න.**



**Online හරහා විදෙස්වලට විකිණීමට නිවෙස් තුළ දීම අත්කම් භාණ්ඩ ඇතුළු විවිධ දේ නිපදවීම ද සුළුවෙන් හෝ අරඹන්න**

විවිධ දක්ෂතා සහ නිපැයුම් හැකියා ඇති සෑම කෙනෙකුම තම නිවෙස් තුළ දීම අත්කම් භාණ්ඩ ඇතුළු විවිධ දේ නිපදවීම ද සුළුවෙන් හෝ අරඹන්න. ඔබගේ භාණ්ඩ අන්තර්ජාලය හරහා විදෙස් වලට විකිණීමේ විශේෂ වැඩ වැඩපිළිවෙලක් ලංකාද්වීපය ගොඩගැනීමේ අප දෙවන අදියරෙන් හඳුන්වා දෙන්නෙමු.

**සියලු විස්තර www.swayanposhana.lk වෙබ් අඩවියෙන් සහ MethsaviyaTV Youtube නාලිකාවෙන් ලබා ගත හැක. මීට අමතරව මෙත්සවිය දුරකථන අංක 0701558558 හරහා අවශ්‍ය බීජ, උපදෙස් සහ තාක්ෂණය ලබාදීමට ඔබගේ නම, ලිපිනය සහ අවශ්‍යතාවය ඇතුලත් කෙටි පණිවිඩයක් එවන්න.**

පුරවැසියෙකු ලෙස ඔබගේ වගකීම ඉටු කර, රට ස්වයංපෝෂණය කර වත්මන් දුක අපගේ දරුවන්ට ද විඳින්නට ඉඩ නොතබා ලංකාද්වීපය ලෝකයේ ශ්‍රේෂ්ඨතම රටක් බවට පත් කිරීමේ ප්‍රයත්නයට සහයෝගය දක්වන්න.

මෙය කිසිදු දේශපාලන පක්ෂයකට සම්බන්ධ නැති වැඩපිළිවෙළක් බව කරුණාවෙන් සලකන්න.

**බීජ, පළැටි ආදිය සපයා මෙම සද්කාර්යයට දායකවීමට කැමති අය වෙත්නම් මෙත් සවිය උප සභාපතිවරුන් වන චින්තක බණ්ඩාර/කෝසල ඒදිරිසිංහ අමතන්න: 0714 014 467**


**මෙයට මෙත් සිත් පෙරදැරි**

**ගරු සම ලේකම් මංජුල පද්මකුමාර / ගරු සම ලේකම් පියල් චන්ද්‍රතුංග**

**මෙත්සවිය, 55, ශ්‍රී ලංකාරාමය, ලෙස්ලි රණගල මාවත, කොළඹ 8**

**Web: www.methsaviya.lk / දුරකථන: 0714014467, 0112505088**



## මියගිය සාමාජිකයින් උදෙසා සිදුකරන ලද පුණ්‍යානුමෝදනාපූර්වක



2021 දෙසැම්බර් 13 වන ඉරුදින

# මෙත් සවිය

# අනුස්මරණ පිංකම

මෙත්සවිය කමිටු සාමාජික ව සිටි පී.පී. තිලකසිරි මහතා ඇතුළු පසුගිය වසර 19 තුල මෙත්සවියේ මියගිය සාමාජිකයින් සහ ඔවුන්ගේ පවුල්වල මියගිය අය සඳහා පුණ්‍යානුමෝදනා පෙරදැරිව බොරැල්ල ශ්‍රී ලංකාරාමයේදී පැවැත් වූ වාර්ෂික සංඝගත දක්ෂිණාවේ අවස්ථා කිහිපයක්.




















# පුණ්‍යානුස්මරණ දානමය පිංකම

**මිය ගිය මෙත්සවිය සාමාජිකයින් සහ වත්මන් සාමාජිකයින්ගේ මියගිය ඥාතීන්ට පින් පැමිණවීමේ අදිටනින් 2021. 12. 13 පවත්වන්නට යෙදුන දානමය පුණ්‍යකර්මය. (වාර්ෂිකව පවත්වන පිංකමකි, 2022 වසරේ පිංකම සැප්තැම්බර් මස මුලදී පැවැත්වීමට බලාපොරොත්තු වේ.)**

මෙත් සවිය මනස අධ්‍යාපන මෛත්‍රී සංසදයේ සාමාජිකත්වය දරා අපවත් වී වදාළ සහ මියගිය මෙත්සවිය සාමාජිකයින් සහ වත්මන් සාමාජිකයින්ගේ මිය ගිය ඥාතීන්ට පින් අනුමෝදන් කිරීම පිණිස සහ සුජීවත්ව වාසය කරන සැමට ආශිර්වාද ප්‍රාර්ථනා කරනු පිණිසත්, 2021 දෙසැම්බර් මස 13 වන දින මහා සංඝරත්නය විෂයෙහි සංඝගත දක්ෂිණාවක් පුදකෙරිනි.

- මෙත් සවිය ගරු අනුශාසක ධූරය හෙ, බවමින් වැඩසිට අපවත් වී වදාළ අමරපුර මහා නිකායේ උත්තරීතර මහා නායක කොටුගොඩ ධම්මාවාස ස්වාමීන්වහන්සේ,
- ඉන් අනතුරුව මෙත් සවිය ගරු අනුශාසක ධූරය හොබවමින් වැඩසිට අපවත් වී වදාළ අමරපුර නිකායේ ගරු අධිකරණ සංඝනායක පූජ්‍ය අහංගම ආනන්ද නායක ස්වාමීන්වහන්සේ,
- මෙත් සවිය සභාපති මහචාර්ය චන්දන ජයරත්න මහතාගේ මෑණියන් වූ ඩී. ඒ. ජයරත්න මාතාව සහ කේ. එස්. ජයරත්න පියාණන්,
- අරිසෙන් අහුබුදු ශූරීන්,
- ඉතා ක්‍රියාකාරී සාමාජිකයකුව සිට 2021.09.13 දින අප අතරින් වෙන් වූ මෙත් සවිය සාමාජික ජී. ජී. තිලකසිරි මහතා,
- ලලිත් සුරංග මහතා,
- සෙව්වන්දි මහත්මියගේ මෑණියන්,
- හේමන්ත ජයසිංහ මහතා,
- එම්. ජී. සංඝදාස මහතා,
- නන්දනී පෙරේරා මහත්මිය,
- වී. පී. අයි. විතාන මහත්මිය.
- හිල්ඩා නොන්සි අපෝන්සු මහතා,
- ස්වර්ණා සුවාරිස් මහත්මිය,
- සාවිත්‍රී වික්‍රමසිංහ මහත්මිය,
- පත්මා පුංචිහේවා මහත්මිය,
- රංජිත් මුණසිංහ මහතා,
- ඩබ්. පී. මෙන්ඩිස් මහතා සහ මහත්මිය,
- ජේ. එම්. ජයසේකර මහතා සහ මහත්මිය,
- ආර්. මාලනී ප්‍රනාන්දු මහත්මිය,
- කේ.ඩී. කරුණාදාස මහතා,
- සෝමාවතී මෑණියන්,
- ඒ. හර්මන් ප්‍රනාන්දු පියාණන්,
- ලාල් ලක්ෂ්මි විජේවර්ධන මහතා.
- මාලනී සිල්වා මෑණියන්,
- පී. ජේ. වාසගේ පියාණන්,
- එච්. ඩී. ජයසිංහ පියාණන්,
- පී. එච්. මල්ලිකා මෑණියන්,
- කුසුමා ලාලනී ප්‍රනාන්දු මහත්මිය,
- එම්. කේ. වින්ටන් පියාණන්
- කුසුමා ඇල්විටිගල මෑණියන්,
- ස්ටීවන් ද සිල්වා පියාණන්,
- මල්ලිකා ද සිල්වා මෑණියන්,
- සුනිල් ශාන්ත ද සිල්වා මහතා,
- වැලිකඩගේ සිරිසේන පෙරේරා මහතා,
- මාග්‍රට් පෙරේරා මෑණියන්,
- විපුලසේන පෙරේරා මහතා,
- මුහන්දිරම් මහතා,
- එච්.එන්. ප්‍රේමවතී මෑණියන්,
- එම්. ඩී. සලමන් පියාණන්,
- සුගතදාස නැලිගම පියාණන්,
- පියසිලි වගවත්ත මෑණියන්,
- ලක්ෂ්මන් නැලිගම මහතා,
- පී. සිසිලින් මෑණියන්,
- සිල්වෙස්ටර් පෙරේරා මෑණියන්,
- බැසිල් සමරතුංග පියාණන්,
- ඇන්ඩෘ ජයමහ පියාණන්,
- මැටිල්ඩා ෆොන්සේකා මෑණියන්,
- රොලන් ප්‍රනාන්දු පියාණන්,
- ජොසපින් පෙරේරා මෑණියන්,
- බී. එච්. රත්නායක පියාණන්,
- එච්. එම්. එස්. හේරත් මෑණියන්,
- පියසිලි දහනායක මෑණියන්,
- සෝමපාල සිල්වා පියාණන්,
- ඩොනල් සිල්වා පියාණන්,
- ලිලී පෙරේරා මෑණියන්,
- ඩී. එච්. ඩබ්ලිව්. වික්‍රමතුංග පියාණන්,
- චාර්ල්ස් පෙරේරා මහතා,
- උක්කු බණ්ඩාර පියාණන්,
- කිරිබණ්ඩා පියාණන්,
- කිරි මැණිකේ මෑණියන්,

ඇතුළු මෙහි නම් සඳහන් වූ හා නොවුනු සියලුම දෙනාට මෙම පුණ්‍යකර්මයේ පින් අත්පත් වේවා! එමෙන්ම ම සියළු මෙත්සවිය සාමාජිකයින්ගේ මිය ගිය මව, පියා, බිරිඳ, ස්වාමිපුරුෂයා, සහෝදර සහෝදරියන්, දූ දරුවන් ඇතුළු සියලුම ඥාති හිත මිත්‍රාදීන් මෙම පිං අනුමෝදන් ව සුගතගාමී වේවා!

බොරැල්ල ශ්‍රී ලංකාරාමාධිපති වීරගොඩ ඥාන ස්වාමීන්වහන්සේටත්, මෙත් සවිය සියළු සාමාජිකයින්ටත් නිදුක් නිරෝගී බව හා ඉතා ඉක්මන් භවයක දී චතුරාර්ය සත්‍ය පසක්කොට නිවන් අවබෝධය කිරීම පිණිසම මෙම පින අනුමෝදන් කරන්නෙමු.



# පිනක් නිවනට
# පාරමිතාවක් කර ගන්නා ආකාරය.

ලෝකයේ බොහෝ දෙනකුන් පින් කරනුයේ දිව්‍යලෝක මනුෂ්‍ය ලෝකයන්හි ඇති සැප සම්පත් පිණිස ය. භවභෝග සම්පත් පතා කරන ඒ තෘෂ්ණා නිඃශ්‍රිත කුශලයෝ භවභෝග සම්පත් ලබාදීමට ම මිස සත්ත්වයා සම්බෝධියට හා නිවනට පැමිණවීමට සමත් නො වෙති.

නිවනට පැමිණ වීමේ සමත් බව නැති, සසර දික් කරන්නා වූ ඒ කුශලයෝ පාරමී සංඛ්‍යාවට නො වැටෙති. ඇතැම්හු කීර්තියට ප්‍රශංසාවට ආශාවෙන් ද පින් කරති. එසේ කරන කුශලය නිවනට තබා භවභෝග සම්පත් මැනවින් ලබා දීමට ද සමත් නො වේ. තෘෂ්ණා නිඃශ්‍රිත වූ එබඳු කුශලයෝ ද පාරමීහු නො වෙති.

ඇතැම්හු, තමන්ගේ උසස් බව, සමත් බව, ගුණවත් බව, පොහොසත් බව, ලොවට හෙළි කිරීමේ අටියෙන් පින් කරති. ඇතැම්හු පින් කිරීම් වශයෙන් අනුන් යටපත් කිරීමේ අටියෙන් අනුන් දන් දුන්නාට වඩා මහත් කොට දන් දෙති. අනුන් සිල් රකිනවාට වඩා උග්‍රකොට සිල් රකිති. අනුන් කළ පින්කම්වලට වඩා මහත් කොට පින්කම් කරති. අනුන් කරවූ වෙහෙර විහාරවලට වඩා මහත් වූ වෙහෙර විහාර කරවති. මාන නිඃශ්‍රිත වූ එබඳු පින් ද පාරමීහු නො වෙති. එබඳු පින්කම්වල ද නිවන් ලැබීමේ තබා භවභෝග සම්පත් ලැබීමේ ශක්තිය ද හීන ය.

ඇතැම්හු විදර්ශනා මාර්ගඵලයන් ගැන සැලකීමක් නො කොට මේ දානය ම, මේ ශීලය ම, මේ තපස ම, සත්ත්වයාගේ විශුද්ධියට හේතුව ය. විශුද්ධියට මෙය හැර අන් හේතුවක් අන් කළ යුත්තක් නැතය යි වරදවා ගෙන දානාදියෙන් ම විශුද්ධියට පැමිණීමේ බලාපොරොත්තුවෙන් පින් කරති. දෘෂ්ටිය නිඃශ්‍රය කොට ඇති ඒ කුශලයෝ ද පාරමී සංඛ්‍යාවට නො පැමිණෙති. එබඳු දෘෂ්ටි නිඃශ්‍රිත කුශලයන් බොහෝ සෙයින් කරන්නේ අබෞද්ධයන් විසිනි. ආගම හොඳින් නො දැන අඳුරේ අත ගෑමක් සේ ආගම අදහන ඇතැම් බෞද්ධයෝ ද එබඳු දෘෂ්ටි නිඃශ්‍රිත කුශලයන් කෙරෙති.

මෙකල පින් කරන බොහෝ දෙනා සිරිතක් වශයෙන් ම භව භෝග සම්පත්ති ය, නිවනය යන දෙක ම පතති. දෙපැත්ත ම පතා කරන ඒ කුශලයෝ පාරමී සංඛ්‍යාවට යෙත් ද? නො යෙත් ද? යන බව සැලකිය යුත්තකි. භවභෝග සම්පත් පැතුවේ ද අවසානයට බෝධිය හා නිවන පතන බැවින් ඒවා පාරමී නො වෙති යි නො කිය හැකිය. එහෙත් ඒවා භව භෝග සම්පත් පිළිබඳ වූ තෘෂ්ණාවෙන් දූෂිත බැවින් ඉක්මනින් බෝධිය කරා, නිවන කරා පැමිණවීමට සමත් කුශලයෝ නො වෙති....

ඒ බව පෙර බරණැස් නුවර පසේ බුදු කෙනකුන්ට උක් පැණි දන් දුන් සහෝදරයන් දෙදෙනාගේ කථාවෙන් තේරුම් ගත යුතු ය.

ඒ මෙසේය:

පෙර මේ කපින් අනූ එක්වන කපෙහි බරණැස් නුවර විසූ සහෝදරයෝ දෙදෙනෙක් උක් කෙතක් වැවූහ. ඔවුන් වැවූ උක් වර්ගය පැණි ගැනීමට නො මිරිකිය යුතු වූ කැපූ තැනින් පැණි සියල්ල ගලා බස්නා වූ උසස් වර්ගයකි. ඒ වර්ගයේ උක් වර්තමාන ලෝකයේ ඇති බව අසන්නට නැත. ඔවුන් දෙදෙනාගෙන් බාල සහෝදරයා දිනක් උක් කෙත බලන්නට ගොස් හැරී එනුයේ තමාගේ ප්‍රයෝජනයට එකක් ගැනීමට හා වැඩි මහලු සහෝදරයාට එකක් දීමට ද සිතා උක් දඬු දෙකක් ද කපා ගෙන ආවේ ය.

ඔහුට අතර මගදී පසේ බුදුවරයන් වහන්සේ නමක් හමු විය. ඔහු පසේ බුදුන්ට පැහැදී උතුරු සළුව එලා එහි උන්වහන්සේ වැඩ හිඳුවා, තමා පිණිස ගෙනා උක් දඬුව ගෙන පැණි ගලා නො යනු පිණිස එය වසා බැඳ තිබූ රෙදි කඩ ඉවත් කොට එහි පැණි පසේ බුදුන් වහන්සේගේ පාත්‍රයට එළවී ය. උක් පැණියෙන් පාත්‍රය පිරී ගියේය. පසේ බුදුන් වහන්සේ එය වැළඳූ කල්හි වඩාත් පහන් වූ සිත් ඇති පුරුෂ තෙමේ

"වැඩි මහලු සහෝදරයා මුදල් ගන්නේ නම් මුදල් හෝ පින් ගන්නේ නම් පින් හෝ ඔහුට දෙමි"යි සිතා දෙවන උක් දඬුවේ පැණි ද පසේ බුදුන් වහන්සේට ම පුදා පසඟ පිහිටුවා වැඳ "ස්වාමීනි, මා විසින් යම් අග්‍ර රසයක් නුඹ වහන්සේට පුදන ලද ද, ඒ පිනෙන් දිව්‍ය මනුෂ්‍ය ලෝකයන්හි සම්පත් වළඳා අවසානයේ දී නුඹ වහන්සේ පැමිණි ධර්මයට ද පැමිණෙම්වා"යි ප්‍රාර්ථනය කළේ ය.

ඔහු ගෙට ගිය කල්හි වැඩි මහලු සහෝදරයා "කොහි ගියෙහිද" යි විචාළේය. හේ උක් කෙත බලන්නට ගිය බව හා උක් දඬු දෙකක් ගෙන ආ සැටිත් ඒවා පසේ බුදුන් වහන්සේට පිදූ සැටිත් කියා ඔබ ගේ උක් ගසට මිල ගන්නෙහි ද? පින් ගන්නෙහිදැයි ඇසීය. වැඩි මහලු සහෝදරයා පසේ බුදුන් වහන්සේ කළ කී දේ විචාර ඔහුගේ උක් ගසේ පැණි පසේ බුදුන් වහන්සේ විසින් අහසින් ගන්ධමාදන පර්වතයට ගෙන ගොස් පන්සියයක් පසේ බුදුවරයන් වහන්සේට දුන් සැටි කී කල්හි, මහත් සතුටට පැමිණි හෙතෙමේ මිළයක් නො ඉල්ලා නොයෙක් දේ නො පතා "තමා මෙ උක්ගස් පැණි දුන් පිනෙන් තමාට ද ඒ පසේ බුදුන් වහන්සේ විසින් දක්නා ලද ධර්මය අවබෝධ කරගන්නට, දක්නට ලැබේවා"යි කෙළින් ම නිවන ප්‍රාර්ථනය කෙළේ ය.

මෙම උක් පැණි දන් දුන් සහෝදරයෝ දෙදෙන ආයු ඇති තාක් සිට මරණින් මතු දෙව්ලොව ඉපද, බොහෝ කලක් දිව සැප වළඳා විපස්සී බුදුන් වහන්සේ ගේ කාලයේදී දෙව් ලොවින් චුත ව, බන්ධුමතී නගරයේ එක් කුලගෙයක වැඩිමහල්ලා වැඩිමහලුව ද, බාලයා බාලව ද උපන්හ. ඔවුන් දෙදෙනාගෙන් වැඩිමහල්ලා "සේන" නම් විය. බාලයා "අපරාජිත" නම් විය. ඔවුන් වැඩිවිය පැමිණ වෙසෙන කල්හි, වැඩිමහලු සහෝදරයා බුදුන්වහන්සේ වෙත දහම් අසන්නට යන්නවුන් හා විහාරයට ගොස් දහම් අසා සසර කලකිරී බුදු සස්නෙහි පැවිදි ව නොබෝ කලකින් ම විදසුන් වඩා සියලු කෙලෙසුන් නසා අර්හත් ඵලයට පැමිණියේ ය.

උක් පැණි දන් දුන් කුශලයේ මූලිකයා වූ බාල සහෝදරයා බොහෝ බණ අසා ද වස්තුකාම ක්ලේශ කාමයන් දුරු කරන්නට නො සමත් වීමෙන් ඒ බුදු සස්නෙහි දී නිවන් දකින්නට නො සමත් විය.

හේ ඒ බුදු සස්නෙහි ද බොහෝ පින් කොට නැවත ද දෙව්ලොව උපන. විපස්සී බුදුන් වහන්සේගේ කාලයෙන් කල්ප සැටකට පසු මේ

කපින් එක්තිස් වන කපෙහි "සිඛීය, වෙස්සභූය" යි බුදුවරයෝ දෙනමක් ලොව පහළ වූහ. අපරාජිත ඒ බුදුවරයන්ගේ සසුන්වල දී ද නිවන් දක්නට නො සමත් විය.

ඉන් පසු මෙ කප කකුසඳ, කෝණාගම, කාශ්‍යප යන බුදුවරයන් වහන්සේලා ලොව පහළ වූහ. උන් වහන්සේලාගේ සසුන්වලදී ද හේ නිවන් නො ලැබුවේය. කාශ්‍යප බුදුන් වහන්සේගේ සස්න ද ඉක්මී අප බුදුන් වහන්සේ ලොව පහළ වූ පසු උන්වහන්සේ ගේ කාලයෙහි "ජෝතිය" නම් සිටුවරයකුව උපන් අපරාජිත, බුදු සස්නෙහි පැවිදි ව, තමා හා එකට පින් කොට නිවන පමණක් පැතූ සහෝදරයා නිවන් දැක කල්ප අනූවකින් පසු, බුදුවරයන් වහන්සේලාගේ සසුන් පසක් ඉක්ම ගියාට ද පසු, නිවන් දුටුවේ ය.

භවභෝග සම්පත් ද සමග නිවන් පතන්නා වූ තැනැත්තාට සසර දික් වන සැටි, ලෙහෙසියෙන් නිවන් නො ලැබෙන සැටි, මේ කථාවෙන් තේරුම් ගත යුතුය.


භවභෝග සම්පත් සහිත ව නිවන පතන්නා ගේ කුශලය තෘෂ්ණාව නිසා දුබල වන බැවින් එබඳු පින් කළ තැනැත්තා හට බුදු සස්නක් හමු වූ විටෙක දහම් හඬ ඇසුනේ ද කාමයන් හැර දැමීමට තරම් ශක්තියක් නො ලැබේ. ඔවුනට නිවන් ලැබීමට කල් ගත වන්නේ එහෙයිනි.

භවභෝග සම්පත් නො පැතුයේ ද බෝධිය හෝ නිවන පමණක් හෝ පතා පින් කරන්නා හට අඩුවක් නැතිව භවභෝග සම්පත් ලැබෙන්නේ ය. හේ ලැබෙන භවභෝග සම්පත්වල ඒවා පැතූ තැනැත්තන් පමණට නො ඇලෙන්නේ ය. දීමට හා සම්පත් හැර දැමීමට හේ සමත් වන්නේ ය. එබැවින් හේ දන් දීමෙන් උසස් ලෙස භවභෝග සම්පත් ද ලබන්නේය. සුදුසු අවස්ථාව දුටු විට ඒවා හැර පැවිදි වන්නට ද සමත් වන්නේ ය. එබැවින් හේ ඉක්මනින් නිවන් දක්නේ ය.

පිනක් කිරීමේ දී අන් කිසිවක් නොව නිවනම පරමාර්ථ කොට පින්කම් කෙරේ වා..!!! තුන් ලෝකාග්‍ර වූ භාග්‍යවත් වූ අරහත් වූ සම්මා සම්බුදුරජාණන් වහන්සේට මාගේ නමස්කාරය වේවා. මේ දහම් පඬුර පූජා කරමි පූජාම වේවා.!

**අතිපූජ්‍ය රේරුකාණේ චන්දවිමල මහා ස්වාමීන් වහන්සේගේ "පාරමිතා ප්‍රකරණය" පොත් වහන්සේ ඇසුරිනි.**

---




**අට මහා කුසලයන්ගෙන් එකක් වන**

# බුද්ධ ප්‍රතිමා නිර්මාණයේ ආනිසංස

මහා බලසම්පන්න චක්‍රවර්ති රජකෙනෙකුන්ගේ ධනය මුළු ලොව පුරා තිබුණද, එය යම් දිනෙක ක්ෂය වී යන්නේය. නමුත් බුදුපිළිම කරවූ අයෙකුගේ ආනිසංස එලෙස වේගයෙන් ක්ෂය නොවී බොහෝ කාලයක් සැප විපාක ගෙනදෙන්නේය.

ලොව සියලු සාගරයන් කිසියම් මිම්මකින් මැන අවසන් කළ හැකි උවද, බුද්ධ ප්‍රතිමා කරවූ අයෙකුගේ ආනිසංස එසේ මැන අවසන් කළ නොහැකිය.

- බුදුරජාණන් වහන්සේ නමක් හැර කිසියම් දෙවියෙකු, බ්‍රහ්මයෙකු මුඛවල් සියයක් මවා ගෙන බුදුපිළිම කරවීමේ ආනිසංස ප්‍රකාශ කරන්නට ගියද එය කිසිදා කියා අවසන් කළ නොහැකිය.
- බුදුපිළිම කරවූ අයෙකු සතර අපායේ ඉපදීම සිදු නොවන්නේය.
- බුදුපිළිම කරවූ අය අරූප ලෝකවල හා අසඤ්ඤ තලවල නූපදින්නේය.
- බුදුපිළිම කරවූ අය ලොකුඹු නරකයේ නූපදින්නේය.
- බුදුපිළිම කරවූ අය බුදුවරුන් පහළ වෙන මගුල් සක්වල හැර පිට සක්වලවල් වල නූපදින්නේය.
- බුදුපිළිම කරවූ අය උප්පත්තිය ලබන සෑම ආත්ම භාවයකදීම රන්, රුවන්, මුතු, මැණික් ලබන්නේය. සියලු සම්පත්තියෙන් ආඪ්‍ය වන්නේය.
- බුදුපිළිම කරවූ අය උසස් යැයි සම්මත ජාති සම්පන්න කුලයන්හි උප්පත්තිය ලබන්නේය.
- බුදුපිළිම කරවූ අය කිසිදු භවයක අංග විකල නොවන්නේය.
- බුදුපිළිම කරවූ අයෙකු කිසියම් භවයක මව්කුස පිළිසිඳ ගත් දා සිට මවට පීඩාවක් නොවන්නේය. දරු ප්‍රසූතියේදී මවට කිසිදු වේදනාවක් ඇති නොවන්නේය.
- උපදින සෑම භවයක සැමගේ ගෞරවයට පාත්‍ර වන මනා රූප කායක් ලබන්නේය.
- උපදින සෑම භවයක නැණ, නුවණ ඇතිව ඉපදෙන්නේය.
- දිව්‍ය ආත්ම භාවයක් ලැබුණද සක් දෙව්රජ හා සම වූ සැප සම්පත් ලබන්නේය.
- නිවන් දකින යම් භවයකදී ඉර්ධිබල සහිතව සිව් පිළිසිඹියාපත් රහත් භාවයෙන්ම නිවන් මගට යොමු වන්නේය.




ගංවතුරින්
විපතට පත් වූවන්ට
තෙදිනක
සහනාධාර
2021 ජුනි මස ගංවතුරින් විපතට පත් අය
සදහා ජුනි 7-9 දින තුන තුල මෙත්සවිය ගංවතුර
සහනාධාර ලබාදීම ඉතා සාර්ථකව සිදු කරන ලදී



















# **Dream-reading** *machine of Japan*





Have you ever thought to record and play back your dreams like a movie? Certainly your answer will be" No ". But now recording your dreams is not a dream anymore.

A dream is a series of thoughts or images that happen in your mind during your sleep. As if through a miracle, Japanese scientists have discovered a method to record your dreams by means of the Magnetic Resonance Imagining scanner (MRI Scanner).

In this digitalised era, the development of science and technology has transcended all the boundaries making everything possible to achieve. Indeed, humans seem to be undergoing a magical transformation.

## *Theory*

To decode the images in the mind during the sleep with the dream-reading machine, they have integrated the data into the algorithm which reconstructs the dreams. Speaking of the algorithm, it can be used to integrate the data from a brain to the appropriate correlated images. The phenomenon they have used is the fact that the human brain produces hormones when we dream during our sleep.

On the other hand, the hormones produced by the brain is related to what we have dreamt in our sleep. For instance, when we see a rat in our dreams, our brain will produce hormones to distinguish it.

## *Techniques*

According to the studies, the scientists have used two techniques to achieve the goal of the dream-reading machine. In the first technique, a person was asked to sleep in the MRI machine and allowed to dream about something.

The scientists used the EEG readings to identify when the person began to enter a dreaming phase. In the next stage, the same person was woken up and asked to recall what he was dreaming about.

It is reported that this process was repeated nearly 200 times for each a person.


The scientists have divided the collected data and discovered the fact that certain common types of objects from

the persons' dreams could be correlated with the brain patterns as recorded by the MRI scanner.

In the next stage, the scientists have used an internet search engine to look for images that were similar to the objects from the persons' dreams and entered the data into a learning algorithm that can refine the model even further.

The constant experiments and researches implemented by the Japanese scientists have enabled them to discover the "Dream-reading machine".

***Source : Sunday Observer by Isuru Thambawita - 14 February, 2021***




**ඔබ ක්‍රිස්තියානි ආගම අත්හැරියේ ඇයි?** යන්න බොහෝ දෙනා මගෙන් අසන ප්‍රශ්නයකි. මම කුඩා කාලයේ පල්ලියට යාමට කැමැත්තක් නොදැක්වූවෙමි. නමුත් මට එහි යන්නට සිදුවුණි. මා ක්‍රමයෙන් වැඩන විට, මගේ දැනුම පුළුල් වනවිට දෙවියන් වහන්සේ පිළිබඳ මගේ හැඟීම් වෙනස් විය. මම අනෙකුත් ආගම් හදාරන්නට පටන් ගතිමි.

බුදුදහම ගැන මට උසස් දැනුමක් ලැබුණි. එය විෂය දැනුමෙන් ඔබ්බට ගොස් ප්‍රායෝගික පුහුණුවෙන් ලද අවබෝධයකි. ඉස්ලාම් හා ක්‍රිස්ත්‍රියානි ආගමිකයන්ට කුරානය හා බයිබලය නමින් ශුද්ධ ග්‍රන්ථ තිබේ. බෞද්ධයන්ට එක පොතක් නොවෙයි පුස්තකාලයක් ම ඇත.

පාලි, සංස්කෘත හා චීන භාෂාවලින් ලියැවුණු ධර්ම ග්‍රන්ථ තිබේ. මහායාන, තේරවාද හා තිබ්බත වශයෙන් ඒවා විවිධයි. ඒ සියල්ලම හැදෑරීම අනවශ්‍යයි. ඔබට කැමැති දෙයක් තෝරාගත හැකිය.

ත්‍රිපිටකයේ එන සුත්ත නිපාතය හා ධම්මපදය අනුව කටයුතු කිරීම වුවත් බෞද්ධයකු වන්නට ප්‍රමාණවත් වෙයි. විශ්වාසය (*Belief* - බිලීෆ්) සහ ශ්‍රද්ධාව (*Faith* - ෆෙත්) යනුවෙන් ඉංග්‍රීසි වචන දෙකක් ඇත. විශ්වාසය අනුව හේතු සෙවීමක්, තර්ක කිරීමක් නොකොට සත්‍යය පිළිගැනීමයි. ඒ ගැන විමසිය නොහැක.

දෙවියන් වහන්සේ ගැන ප්‍රශ්න කළ නොහැකිය. දේවවාක්‍ය ප්‍රශ්න කිරීමකින් තොරව ඇදහීම විශ්වාසය (*Belief* - බිලීෆ්) යි. පොතපත කියවීමෙන්, හේතු සාධක සොයාගැනීමෙන් හා ප්‍රායෝගික පුහුණුවීමෙන් ලැබෙන අත්දැකීම් මත සිතෙහි ඇතිවන පැහැදීම ශ්‍රද්ධාව (*Faith* - ෆෙත්) යි. එය බුද්ධිමය පිළිගැනීමකි. බුදුරදුන් සැබැවින්ම බුද්ධත්වයට පත්වෙලාද? යන්න වුවත්, විමසා බලන්නට බුදුදහමෙහි අවසර ඇත.

යම් කෙනෙකු බුදුදහම පිළිගන්නේ තමන්ම ප්‍රත්‍යක්ෂ කරගන්නා දැනුම පදනම් කරගත් ශ්‍රද්ධාවෙනි. ඒ අනුව විශ්වාසය හා ශ්‍රද්ධාව යන වචන දෙකෙහි තේරුම වෙනස්ය.විශ්වාසය මඟින් සිදුවන්නේ අපේ බුද්ධිය පටු සීමාවක් තුළ කොටුවීමකි. එය මනුෂ්‍යත්වයේ වර්ධනයට බාධාවකි. ශ්‍රද්ධාව මත පිහිටා තිබෙන බුදුදහම විවෘත යි. නිදහස් දෙයකි.

මම දෙවියන් වහන්සේ විශ්වාස නොකරනවා නම්, මම තවදුරටත් කිතුනුවකු නොවෙයි. බෞද්ධයන් යාච්ඤා කරන්නේ නැත. බුදුරදුන්ගෙන් කිසිවක් ඉල්ලන්නේ නැත. ඔවුන් සිදුකරන්නේ වන්දනාවයි. එය බුදුරදුන් කෙරෙහි පැහැදීම නැතිනම් පැහැදිලිවීම නිසා ඇතිවන ශ්‍රද්ධාවෙන් සිදුකරන ගෞරවයකි. බුදුරදුන්ගේ ප්‍රඥා ශක්තියට ප්‍රශංසාවකි.

**බටහිර ජනයා අලුත් ආගම් සොයා එන්නේ පැරණි ආගම ගැන අමනාපයෙන් ද?** යන්න මගෙන් අසන ප්‍රශ්නයකි. එහෙම පිරිසක් සිටින්නට පුළුවනි. මැවුම්කාර දෙවියන් පිළිබඳ විශ්වාසය බිඳ වැටීම නිසාත්, එවැනි වෙනස් වීමක් සිදුවෙයි. ඇතැමුන් අදේවවාදී පැත්තට නැඹුරු යි. ඒ අය යොමුවන්නේ බුදුදහම දෙසටය. අනෙක් කරුණ තමයි ක්‍රිස්තියානි ආගමේ පිළිපදින්නට තිබෙන දේවල් අඩුයි. බුදුදහමේ පිළිපැදීමට තිබෙන කාරණා බහුල යි.

ඒ පිළිපැදීම් මඟින් ජීවිතයේ හා මනසේ වෙනසක් සිදුවෙයි. එවැනි අලුත් අත්දැකීම් ලබාගැනීමට කැමැති පිරිසක් බටහිර රටවල සිටිති. ජේසුතුමා බඩුමුට්ටු පටවාගෙන රටින් පිටවන අකාරයේ කාටූන් චිත්‍රයක් මම ජර්මනියේ සඟරාවක දුටුවෙමි. එහි මාතෘකාව වුණේ ක්‍රීඩාවෙන් පැරදීම යන්නයි. අතීතයේ ක්‍රිස්තියානි ආගමට විශාල ශක්තියක් තිබුණි. අනෙකුත් ආගම් ඇදහීම එයින් පාලනය කෙරුණි.

දඬුවම් පැනවුණි. දැන් ඒ තත්ත්ව වෙනස් වී ඇත. අනිකුත් ආගම් ගැන දැන ගැනීමට විවිධ මාධ්‍යයන් පවතියි. බෞද්ධ හා හින්දු ආගම් අදහන අය බටහිර රටවල පදිංචිව සිටිති. බුදුදහම බටහිර ලෝකයේ ප්‍රචලිත වන්නේ ඒ හේතුවෙනි.

මගේ මිතුරකු ඔහු ගැන මට හඳුන්වා දුන්නේ ඔහු උපතින්ම බෞද්ධයෙක් යනුවෙනි. ධර්මය ගැන තේරුමක් අවබෝධයක් නොමැතිව කුඩා දරුවකු බෞද්ධයකු වන්නේ කොහොමද? බෞද්ධයකු වීම ආධ්‍යාත්මික වර්ධනයක් තුළින් සිදුවිය යුත්තකි. ආගම මව්පියන්ගෙන් ලැබුණු දෙයක් වුවත්, කෙනෙකුට වෙනත් ආගමක් පිළිපැදීමට අයිතියක් තිබේ. බෞද්ධයකු වන්නේ කෙසේද? එය සරලව මෙන්ම සවිස්තරවපිළිතුරු දියහැකි ප්‍රශ්නයකි. සාමාන්‍යයෙන් බුද්ධ, ධම්ම හා සංඝ යන තෙරුවන් සරණ යාමෙන් බෞද්ධයකු බවට පත්වෙයි.

නමුත් එය තහවුරු වන්නේ තෙරුවන් අනුගමනය කිරීමෙනි. බුදුදහමෙන් ප්‍රතිඵල ලැබෙන්නේ ධර්මය පිළිපැදීමෙන් පමණයි. පැවිදි බව කියන්නේ ජීවිතය මුළුමනින්ම ධර්මය කෙරෙහි යොමුකිරීමකි. එය ප්‍රසිද්ධියේ පොරොන්දු වීමකි. පැවැදි නොවී ගිහි බෞද්ධයකු ලෙස ද ජීවත් විය හැක. භාවනාව, පිරිසුදු ජීවිතය හා පන්සිල් රැකීම ගිහි බෞද්ධයකුගේ පිළිවෙතයි.

ලංකාව, තායිලන්තය, චීනය ආදි රටවල බුදුදහම තිබේ. ඒ ඒ රටවල අනුගමනය කරන බෞද්ධ සිරිත්, විරිත් සම්ප්‍රදායන්හි වෙනස්කම් පවතියි. ඒ රටවල් භූගෝලීය වශයෙන් වෙන්ව පැවතීම එයට එක් හේතුවකි. කතෝලික ආගම පාලනය කරන වතිකානුව මෙන් බුද්ධාගම පාලනය කරන මාධ්‍ය ඒකකයක්, මූලස්ථානයක් නොමැතිකම බුදුදහම මුල්කරගත් සංස්කෘතිය හා සම්ප්‍රදාය නිදහසේ සංවර්ධනය වීමට තවත් හේතුවකි. එවැනි වෙනස්කම් තිබුණත්, කර්මය, පටිච්ච සමුප්පාදය, චතුරාර්ය සත්‍යය වැනි මූලික බෞද්ධ ඉගැන්වීම් සෑම රටකම නොවෙනස්ව පවතියි.

බුදුදහම ජීවන මාර්ගයක් යැයි හඳුන්වන්නට මම ඉක්මන් නොවෙමි. එය ආධ්‍යාත්මය තේරුම් ගැනීමට මඟ පෙන්වන ප්‍රායෝගික ක්‍රියා පිළිවෙතකි. බුදුදහමෙහි සඳහන් භාවනාව කෙරෙහි දිනපතා යොමුවන්නේ නැතිනම්, එයින් ප්‍රතිඵල ලබාගත නොහැක. තමන්ගේ ජීවන රටාව අනුව භාවනාවේ යෙදීම අමාරු බව සමහරු කියති. දිනකට විනාඩි විස්සක් භාවනාවේ යෙදෙන්න. එම කාලය ක්‍රමයෙන් වැඩි කරගන්න. මිනිස්සු විවිධයි.

භාවනාවෙන් මනස වෙනස් කෙරෙන නිසා සමහරු භාවනාවට භයයි. ඇතැමුන්ට භාවනාව ගැන වැරැදි වැටහීමක් ඇත. ඔවුන් සිතන අන්දමට භාවනාව යනු ජීවිතයෙන් පලායාමකි. ඒ විවේචන කරන අයගේ කටයුතු දිහා බැලුවත්, ජීවිතයෙන් පලායාමක් දකින්නට පුළුවන. පැය දෙක තුනක් රූපවාහිනිය දෙස බලා සිටීම සැබෑ ජීවිතයෙන් පලායාමක් නොවිද? එසේම මත්ද්‍රව්‍ය ගැනීමෙන් සිදුවන්නේ සාමාන්‍ය ලෝකයෙන් වෙන්වීමක් නොවේද? ඔබ එවිට ජීවත්වන්නේ සැබෑ ලෝකයේ නොවේ. එහෙත් භාවනාව එවැනි දෙයක් නොවේ. භාවනාවෙන් සිදුකරන්නේ අපේ ජීවිතයට සමීපව එබී බැලීමකි.

වයස්ගත, අසනීපයෙන් පසුවන අපට ජීවත්වන්නට සිදුවන්නේ අනුන්ගේ උපකාරයෙනි. අසනීපයෙන් නැතිනම් වයස්ගතව සිටින කෙනකුට වුවමනා දෙය වෙලාවට නොලැබුණොත්, නොසන්සුන් බවක්, තරහක් සිතේ ඇතිවෙයි. ඔහුට නිතරම පෙනෙන්නේ සාත්තු සේවකයන්, පවුලේ පිරිස, දරුවන් කරන හැමදේම වැරැදි විදියට යි. ඔවුන්ට විරුද්ධව මැසිවිලි නැගීම, දොස් කීම, පැමිණිලි ඉදිරිපත් කිරීම එවැනි අයගේ පුරුද්දකි. හිතුවක්කාර මුරණ්ඩු ගති මතුවෙයි.

මා සිතන පරිදි, කෙනකු කයික වශයෙන් පිරිහෙන්නට පෙර භාවනාව මඟින් මානසික ශක්තිය ගොඩනගා ගෙන තිබුණා නම්, රෝගී වනවිට, වයස්ගත වනවිට ඇතිවන නොසන්සුන් බව, කෝපය, ගැටුම්කාරී ස්වභාවයන් පාලනය කරගන්නටත්, මානසික ශක්තියක් ගොඩනඟා ගන්නටත් ඔහුට හැකියාවක් ලැබෙයි. මොකද? මේ ජීවිතයේ ඉදිරියට මුහුණ දෙන්නට සිදුවන දේවල් හා ජීවිතයේ අනිත්‍යතාවය ගැන අවබෝධයක් භාවනාවෙන් පුද්ගලයකුට ලැබෙන බැවිනි.

බුදුදහම අනුගමනය කිරීමේ දී පෞද්ගලික උපදේශකයකු ද සිටිය යුතුදැයි? යි සමහරු අසති. අතීතයේ දී වර්තමානයේ තරම් ධර්මය දැනගන්නට පහසුකම් තිබුණොත් නැත. ඒ නිසා කිසියම් ධර්මෝපදේශකයකු සොයා යාමට සිදුවුණි. දැන් පුද්ගල සම්බන්ධතා, පොත්පත් හා ධර්මය උගන්වන මධ්‍යස්ථාන බහුලව ඇත. එමඟින් ධර්මය දැනගන්ට පහසුයි. හැම දෙයක්ම පියවරෙන් පියවර පෙන්වා දීම සමහරුන්ට උවමනා කරයි.

එහෙත් බුදු දහමේ හැම දෙයක් ම එසේ කළ නොහැකියි. මොකද? ආධ්‍යාත්මික වර්ධනය යනු මනස දියුණු කරගැනීමේ දී තමන්ගේ ම අත්දැකීම් මත ප්‍රායෝගිකව ගොඩනගා ගත යුත්තක් නිසයි. ඔබ කලක් ධර්මය අනුව පුහුණු වනවිට ඔබම ඔබගේ ගුරුවරයා බවට පත්වෙයි. ඊළගට ගතයුතු පියවර ඔබට ම වැටහෙයි. සද්ධිවිහාරිකයන් සමග ඔබේ අත්දැකීම් හා ගැටලු සාකච්ඡා කළහැක. එවිට ඒ අය ඔබට මඟ පෙන්වනු ඇත.

**(භන්තේ සංඝරක්ඛිත හෙවත් ඩෙනිස් පිලිප් මහතාගේ දේශන ඇසුරෙනි.)**

**මැදගම ධම්මානන්ද හිමි**
මහනුවර අස්ගිරි මහා විහාරීය කාරක සංඝ සභික

## බුදු දහමට සම්බන්ධ ඉංග්‍රීසි වචන

- *Joss Stick* - හඳුන්කූර
- *Novice* - සාමණේර
- *Monastery* - ආරාමය/සෙනසුන
- *Bodhi* - බෝධිය
- *Cave* - ලෙන
- *Acolyte* - ඇබිත්තා
- *Hermitage* - ආවාස ගෙය
- *Preaching Hall* - ධර්ම ශාලාව
- *Clouds Wall* - වලාකුළු බැම්ම
- *Chapter House* - උපෝසථඝරය
- *Moonstone* - සඳකඩ පහන
- *Buddha Shrine* - බුදු ගෙය
- *Wick* - පහන් තිරය
- *Contributor* - දායකයා
- *Flower Saddle* - මල් ආසනය
- *Buddha Statue* - බුදු පිළිමය
- *Bell Tower* - සණ්ඨාර කුළුණ
- *Golden Fence* - රන් වැට
- *Chief Incumbent* - විහාරාධිපති
- *Compound* - මළුව
- *Feelings* - වේදනා
- *Faith* - ශ්‍රද්ධාව
- *Equanimity* - උපේක්ෂාව
- *Perception* - සංඥා
- *Impermanence* - අනිත්‍ය
- *Concentration* - සමාධිය
- *Monk* - භික්ෂුව
- *Relic Chamber* - ධාතු ගර්භය
- *Merit* - පින / කුසලය
- *Preach* - දේශනා කරනවා
- *The Lord Buddha* - බුදුරජාණන්වහනසේ
- *Demerit* - අකුසලය
- *Meditation* - භාවනාව
- *Heaven* - දෙව්ලොව / සුගතිය
- *Piety* - ශ්‍රද්ධාව / භක්තිය
- *Enlightenment* - බුද්ධත්වයට පත්වීම
- *Devotee* - ශ්‍රද්ධාවන්තයා
- *Retribution* - විපාකය
- *Preaching* - බණ / දේශනා
- *Hell* - නිරය
- *Virtue* - ශීලය
- *Saint* - මුනිවරයා
- *Ten Perfection* - දස පාරමිතා
- *Great Compassion* - මහා කරුණාව
- *Requisite* - පිරිකර
- *Observing Sil* - සල් සමාදන් වීම
- *Sermon* - දේශනාව
- *Repent Of Sins* - පවු ගැන පසුතැවීම
- *Meditating* - භාවනා කිරීම
- *Great Wisdom* - මහා ප්‍රඥාව
- *Wheel Of Life* - භව චක්‍රය
- *Gaining Merits* - කුසල් වැඩීම
- *Ten Recollections* - දස අනුස්සතිය
- *Volition* - චේතනාව
- *Intention* - සංස්කාරය
- *The World Of Desire* - කම්ම ධාතු
- *Dhamma Preaching* - ධර්මය දේශනා කිරීම
- *Refuge* - සරණ
- *Five Conditions* - පංච නියාම ධර්ම
- *Five Precepts* - පංච ශීලය
- *Ten Royal Virtues* - දස රාජ ධර්ම
- *Ten Precepts* - දස ශීලය
- *Ten Fetters* - දස සංයෝජන
- *Four Hells* - සතර අපාය
- *Five Hindrances* - පංච නීවරණ
- *Middle Way* - මැදුම් පිළිවෙත
- *Cycle Of Rebirth* - සසර
- *Equanimity* - උපේක්ෂාව
- *Retribution* - විපාකය

# කෙලෙස් 1500

**10 වන කොටස...**



**අති පූජ්‍ය රේරුකානේ චන්දවිමල හිමියන්ගේ ලිපියක් ඇසුරිනි.**

## 35. සිංගං

සිංග යනු සතුන්ගේ අංගවලට ද නමෙකි. අඟක් සේ ප්‍රශස්ත ලෙස ද තද ලෙස පෙනෙන ද අඟ අන්‍ය වස්තූන් සිදු වීමට පලුදු වීමට සමත් විය. ආහාර බීම අඩු වුවද ශරීරය හා වාසස්ථානය සරසාගෙන සිටීමත් සුමිහිරි ව්‍යාකට කථාව ඇති බවත් මේ සිංග නම් වූ රාගය අධික වූවහුගේ ලක්‍ෂණය ය. මෙය ධනාශාවට වඩා අනර්ථ දායකය. බොහෝ පැවිද්දන් පැවිද්ද කිලිටි කර ගන්නේත් පැවිද්දෙන් පහවන්නේත් මේ සිංග නම් වූ රාගය ඇති වීමෙනි. ධ්‍යානන ළඟින් අහසින් ගමන් කරන පැවිද්දෝ මේ සිංගය නිසා ධ්‍යානයෙන් පිරිහී පියාපත් සුන් පක්‍ෂීන් මෙන් බිම වැටේති. බොහෝ තරුණ තරුණියෝ මේ රාගය නිසා සියදිවි නසා ගනිති. මද පෙන්වීමෙහි දී මෙය නො කියවූවත් මෙය ද සත්ත්වයා අතිශයින් මත් කරවන උමතු කරවන ක්ලේශයකි. මනෝරථපූරණී අටුවාවෙහි එන කථාවක් මෙසේ යː

මහාදාතික නම් රජතුමා සෑගිරියේ අම්බස්තලයෙහි මහා සෑයක් කරවා ගිරිභණ්ඩවාහන පූජාව නම් මහා පූජාවක් කොට කලින් කල සෑගිරියට ස්ත්‍රීන් ද පිරිවරා ගොස් මහා දානයක් දෙයි. ඒ තරුණ වූ ඉතා දර්ශනීය රජු සිරුර ඇති දමිළදේවී නම් දේවියක් වූවා ය. චිත්තත්ථෙර නම් වූ බුඩ්ඨපබ්බජිතයකුට එය දැකීමෙන් බලවත් ලෙස රාගය ඇති විය. ඒ මහණ යන යන තැන දමිළ දේවිය ගැන මට කියන්නට විය. ඒ නිසා ඔහුට උම්මත්තක චිත්තත්ථෙර යන නම ඇති විය. දමිළ දේවිය නොබෝ කලකින් කළුරිය කළා ය. භික්‍ෂූන් වහන්සේ ඔහුගේ මළ සිරුර දැකීමට ගොස් පැමිණි පසු සාමණේරයෝ චිත්ත ස්ථවිරයන් වෙත ගොස් "ස්වාමිනි, ඔබ නිතරම කියමින් සිටි දමිළ දේවිය කලුරිය කළාය. අපි ශරීරය, ශරීරය වෙත ගොස් පෙරලා ආවෙමු" යි කීහ. එය නො අදහා චිත්ත ස්ථවිර උමතු කතා ම කියන්නට ය. මේ මනෝරථපූරණියේ එන කතාව ය.


රාගයෙන් මත් වූවකුට නො කළ හැකි නීච වැඩක්, නො කළ හැකි පාපයක් නැත. රාගයෙන් මත්වූවෝ පරම අපවිත්‍ර ස්ථානයන් සිඹිති. ලෙවකති. ලෝකාචාරය නො ගොස් පියවරු දූවරුන් හා ද පුත්තු මවුන් හා ද සහෝදරියෝ සහෝදරයන් හා ද අසද්ධර්මයෙහි දැන යෙදෙති. සමහරහු මාපියන් පවා මරති. මෙය භයානක ක්ලේශයෙකි. දුරු කිරීමට ද දුෂ්කර ක්ලේශයකි. රාගයෙන් මත් වූවෝ කිසිවකුගේ අවවාදානුශාසනයන් නො පිළිගනී. රාගය දුරු කර ගැනීමට ඇති අපාය නම් අශුභ භාවනාව ය.ඳගෙන පලා ගියේ ය.

## 36. තින්තිණං

ආහාර පාන වස්ත්‍රාදියට ලොල් බව තින්තිණ නම් වේ. බෙදන තැනදී මෙය මටය, මෙය එදිනටය, මෙය මාගේයයි, මෙයයි කියා පොර කෑම හා ගැසීම; කෑමට ගැනීමට නඟුට වනමින් යටහත්කම බලා සිටින සුනඛයා මෙන් ලැබෙන තැන ලැබෙන තුරු යටත බලා සිටීම, හොඳ හොඳ දෙයක් බලාපොරොත්තු වීම තින්තිණ නම් ක්ලේශයේ ලක්ෂණ ය.

## 37. චාපලයං

ආහාර පාන වස්ත්‍රාදියට ලොල් බව තින්තිණ නම් වේ. බෙදන තැනදී මෙය මටය, මෙය එදිනටය, මෙය මාගේයයි, මෙයයි කියා පොර කෑම හා ගැසීම; කෑමට ගැනීමට නඟුට වනමින් යටහත්කම බලා සිටින සුනඛයා මෙන් ලැබෙන තැන ලැබෙන තුරු යටත බලා සිටීම, හොඳ හොඳ දෙයක් බලාපොරොත්තු වීම තින්තිණ නම් ක්ලේශයේ ලක්ෂණ ය.




ඊළඟ සගරාවෙන්... **38. අසභාගවුත්ති**

# නිවේදන සහ නොමිලයේ පළකරනු ලබන සාමාජිකයින්ගේ දැන්වීම්

මෙත්සවිය පුවත් සඟරාවේ පළකිරීම සඳහා එවන සියලු ලිපිද, දාන - ශීල - භාවනා වැඩසටහන්වල දී දායකත්වය දරන පිංවතුන් ද, අනෙකුත් පුණ්‍ය කටයුතු වලට අත හිත දෙන පිංවතුන් ද සඟරාවේ ප්‍රකාශනයට පත් කළ යුතු විස්තර A4 ප්‍රමාණයේ කොළවල පමණක් ලියා භාරදිය යුතුය. සාමාජිකයින්ගේ දැන්වීම් නොමිලයේ පලකරනු ලැබේ. කොළ කැබලි හා තුන්ඩුවල ලියා එවන විස්තර අස්ථාන ගත විය හැකි බැවින් ඒ පිළිබඳ වගකියනු නොලැබේ.

සාමාජික සාමාජිකාවන් විසින් එවන සෑම ලිපියකම හා ලිපිය එවන කවරයේ ද වම්පස උඩ කෙළවරෙහි තම සාමාජික අංකය පැහැදිලිව ලියා තැබිය යුතුය. ඔබගේ ලිපිනය ලියා දිම සඳහා භාවනා වැඩසටහන්වලදී අප විසින් ලබාදෙන ලිපි කවරවල ද අංකය සඳහන් නොකරන හා වැරදි අංක සඳහන් කරන සාමාජිකයින් බොහෝ දෙනෙකු හමුවී ඇත. මේ අය සඳහා පුවත් සඟරාව තැපෑලෙන් නොලැබී යාම පිළිබඳව වගකියනු නොලැබේ.

## මෙත් සවිය දුරකතන අංක

මෙත් සවිය තොරතුරු විමර්ශනය කරනවිට, **පරිපාලන නිලධාරී මහතා අමතන්න. (011-2505088, 0714-014467).** එම දුරකතනවල බිල්පත් ගෙවනු ලබන්නේ මෙත් සවිය මෛත්‍රී සංසදය විසිනි.

අපගේ **වෙබ් අඩවි වන www.methsaviya.org** සහ **www.methsaviya.lk** මගින්ද තොරතුරු ලබා ගත හැකිය.

මීට අමතරව සම ලේකම්වරු වන මංජුල පත්මකුමාර මහතා (071 529 5855) / පියල් චන්ද්‍රතුංග මහතා (071 450 1358) අමතා ද හදිසි තොරතුරු සඳහා වෙබ් කමිටු සභාපති චින්තක බණ්ඩාර මහතා (0718 114 477) අමතා තොරතුරු ලබාගත හැක.

සංසදයේ **සභාපති මහාචාර්ය චන්දන ජයරත්න මහතා ඇමතීම පුද්ගලික දුරකථන අංක 0714 800 800 හෝ 0777 309 385** මගින් **දහවල් 12.00 - 1.00 ත් අතර හෝ රාත්‍රී 9.00 - 10.00 ත් අතර පමණක්** (ඉතා හදිසි අවශ්‍යතාවයක දී සෑම වේලාවක) සිදු කරන්න. (දිනකට දුරකථන පණිවුඩ 30 ක් පමණ ලැබෙන නිසා සංක්ෂිප්ත ලෙස ඔබගේ විමසීම් සිදුකරන්නේ නම් මැනවි.)

## මීළඟ 47 වන භාවනා වැඩසටහන

47 වන භාවනා වැඩසටහන 2022 ඔක්තෝම්බර් මස 16 වන ඉරු දින ඇරඹීමට නියමිතය. ඒ සඳහා 2022/09/30 දින තෙක් නව අයදුම්පත් භාරගනු ලැබේ. ඉන්පසු ලැබෙන අයදුම්පත් ද ඉඩකඩ තිබුනහොත් සලකා බලනු ලැබේ. තවද සාමාජිකත්වය අළුත් කරගත් පැරණි සාමාජිකයින්ට ද ඒ සඳහා සහභාගි විය හැක. සාමාජිකත්වය අළුත් කරගන්නා විට භාවනා වැඩසටහනට පැමිණෙන/නොපැමිණෙන බව කාර්යාලයට දන්වන්න.

## පංච අභිඥා සහ අධිමානසික විද්‍යාව පිළිබඳ 41 වන වැඩමුළුව

ප්‍රායෝගික අධිමානසික විද්‍යාව සහ පංච අභිඥා පිළිබඳව දැනුවත් කිරීමේ 41 වන වැඩමුළුව 2022 - 08 - 28 වන ඉරු දින පෙරවරු 10.00 ට ආරම්භ වේ. 41 වන වැඩමුළුව සඳහා අයදුම්පත් 2022 - 08 - 21 දිනට පෙර භාරදෙන්න. ඉඩකඩ සීමිත බැවින් පළමුව ලියාපදිංචි වන අය සඳහා මූලිකත්වය ලබා දේ.

**T.S.H.TECHNOLOGIES**

**පරිගනක, රූපවාහිනී අලුත්වැඩියාව / ශබ්දවාහිනී උපකරණ නිපදවීම සහ නව නිර්මාණ කරණය**

**071 66 00 317**

(සාමාජික - 43 කණ්ඩායම)

**ගණකාධිකරන හා මූල්‍ය සේවා**

පලපුරුදු, වෘත්තීය ගණකාධිකාරිවරයෙකු වන මෙත්සවිය සාමාජිකයකු තනි පුද්ගල/ හවුල් ව්‍යාපාර, සමාගම් ඇතුළු සියලු ව්‍යාපාරවල විගණනය, ගිණුම් පිළියෙලකිරීම, ආදායම් බදු හා මූල්‍ය කළමනාකරණ උපදෙස් හා සේවාවන් සාධාරණ ගාස්තු යටතේ සපයනු ලැබේ.

**විස්තර : 077 2355117 අමතන්න.**

**දිදුලක ක්‍රියේෂන්ස්**

විසිතුරු නිර්මාණ සමගින් අලංකාරවත් ලෙස

**මුතුකුඩ නිර්මාණය**

මනාලියන්ගේ සහ උත්සව අවස්ථාවන් සඳහා

**සාරි නිර්මාණය කරනු ලැබේ**

**සාමාජිකා - දිලිනි**

බොරලැස්ගමුව - **0773904405**

ප්ලාස්ටික් ප්‍රතිශක්තිකරණය කර

පිඟන්/ කෝප්ප / වට්ටි ආදිය තැනීම රැකියාව කරගත්

සාමාජිකාවකට **(සා.අංක. 34-5228)** නැගී සිටීමට අතහිත දෙන්න...

**ඔබ නිවසේ විසිකරන අනවශ්‍ය ප්ලාස්ටික් ද්‍රව්‍ය තිබේ නම්**

පොල්තෙල් බෝතල්/අයිස්ක්‍රීම් පෙට්ටි/ වතුර බෝතල් ආදිය

භාර දීමට විමසන්න - **0772 353 392**

**ජල රකුසාගෙන් ගැලවෙමු ග්‍රන්ථය**

**කර්තෘ : පියදාස සිල්වා (සා:අ: 15-2738)**



- භාවනාව • ධර්ම දානය
- අභය දානය සඳහා කියවන්න

★ දියේ ගිලීමට ★අමනුස්ස බලපෑම්
★ අකල් මරණ අවමයට
★ ඇමෙරිකාවත් මෛත්‍රී භාවනාවට
★ ලොව ඉහළම කුසලයට
★ බුදුන් වහන්සේට මල් පිදීම තුලින් ...

**මුද්‍රණ වියදම රු. 350**

**අලෙවි මිල රු. 250**

**දු:ක: 075 712 8960**

**පසුගිය වසරේ ලද සියළු පරිත්‍යාග බුදු පිළිමය තැනීම සඳහා පිරිනමන ලදී**

**සයිට් "එන්" ස්ටයිල් ඔප්ටොමෙට්‍රිස්ට්ස්**

**SIGHT 'N' STYLE OPTOMETRISTS**



නො. 126 බී, හයිලෙවෙල් පාර, නුගේගොඩ.

(අනුලා විදුහල ඉදිරිපිට) දුරකථන : 2854758

**(සියලුම වර්ගයේ ඇස් කණ්ණාඩි අවශ්‍යතා සඳහා විමසන්න)**

**මැහුම් කලාව පුහුණු කිරීම**



මැහුම් කලාවේ සුන්දරම නිර්මාණය වූ, රිබන් මෝස්තර නිර්මාණ සහ බ්‍රසිලියන් එම්බ්‍රොයිඩර් පුහුණු කිරීම. නිවස අලංකාරයට බිත්ති සැරසිලි, කුෂන් කවර, මේස රෙදි ආදී බොහෝ දෑ සමඟ කුඩා ළමා ඇඳුම් සිට බිලවුස් සහ සාරිය දක්වාත්, නිවැරදි ලෙස වර්ණ සංකලණය කරමින් සොබා දහමේ සුන්දරත්වය එලෙසින්ම රැකෙන පරිදි ඉතා සියුම් නිර්මාණ පුහුණු කරනු ලැබේ.

**නිමැවුම් භාර ගැනීම සඳහා ද විමසන්න. 077 542 1001**

(ළමා නිවාසවල දැරියන්ට ශක්තියක් වීමට නොමිලේ පුහුණුව දීමට කැමැත්තෙමි)

# මෙත් සවිය මනස අධ්‍යාපන සංවර්ධන මෛත්‍රී සංසදය - සාමාජික අයදුම්පත

**(ඡායා පිටපත් ද භාරගනු ලැබේ. මෙම සියලු තොරතුරු සම්පූර්ණයෙන් රහසිගතව තබා ගනු ලැබේ.)**

01. සම්පූර්ණ නම ..........

02. ස්ත්‍රී / පුරුෂ භාවය .......... 3. ජාතික හැඳුනුම්පත් අංකය ..........

(ඡායා පිටපතක් අමුණන්න)

04. උපන් දිනය .......... 5. වයස .......... 6. ආගම ..........

07. ස්ථිර ලිපිනය ..........

විද්‍යුත් තැපෑල (e-mail) .......... දු:කඃ නිවස .......... ජංගම ..........

08. දිස්ත්‍රික්කය .......... 9. විවාහක / අවිවාහක බව ..........

10. දරුවන් සිටිනම් විස්තර : ගැහැණු දරුවන්ගේ වයස් .......... / පිරිමි දරුවන්ගේ වයස් ..........

11. රැකියාව හා තනතුර ..........

ආයතනයේ නම ඉංග්‍රීසියෙන් ද සඳහන් කරන්නේ නම් මැනවි) ..........

12. කාර්යාලීය විස්තර හා දුරකථන විස්තර ..........

13. ලිපි එවිය යුතු ලිපිනය ..........

14. ලබා ඇති ඉහලම අධ්‍යාපනික සුදුසුකම්,

1. ..........
2. ..........

15. වෙනත් සංගම් ආදියෙහි සාමාජිකත්වය දරන්නේ නම් ඒ පිළිබඳ විස්තර,

1. ..........
2. ..........
3. ..........

16. ඔබ කිසියම් ශාරීරික රෝගයකින් (ඇදුම, හෘද රෝග, දියවැඩියාව, රුධිර පීඩනය, අපස්මාරය) පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර ..........

17. ඔබ කිසියම් මානසික රෝගයක් සඳහා වෛද්‍ය ප්‍රතිකාර / බෙහෙත් ලබාගෙන තිබේද ? ඔව් / නැත .

18. එවැනි මානසික රෝගයකින් පෙලෙන්නේ නම් ඒ පිළිබඳ විස්තර.

..........

19. ඔබ විසින් සඳහන්කළ යුතු මෙහි දී වැදගත් යැයි හැගෙන වෙනත් විස්තර හෝ යෝජනා / අදහස් තිබේ නම් මෙහි සඳහන් කරන්න. ..........

..........

**මා දන්නා තරමින් ඉහත කරුණු සත්‍ය බවට ප්‍රකාශ කරමි. සාවද්‍ය තොරතුරු සැපයීම සාමාජිකත්වය අවලංගු කිරීමට හේතුවක් ලෙස මා පිළිගනිමි.**

දිනය .......... අයදුම්කරුගේ අත්සන ..........

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

තේරීම් කමිටුවේ තීරණය

සාමාජික අංකය ..........

.......... ..........

තේරීම් කමිටු සභාපති විධායක ලේකම් දිනය ..........

සැ:යු:- ඔබ වෙනුවෙන් පවත්වන විවිධ දේශන, වැඩමුළු, මනස දියුණු කිරීමේ වැඩසටහන් සංවිධානය කිරීම, දේශන ශාලා ගාස්තු, ශ්‍රව්‍ය දෘෂ්‍ය උපකරණ ගාස්තු, පුවත් පත් දැන්වීම්, මුද්‍රිත සටහන් සැපයීම්, හැඳුනුම්පත් සැකසීම, තැපැල් ගාස්තු, විදුලි ගාස්තු, කාර්යාලීය ගාස්තු හා පරිපාලන නිළධාරි මහතා වෙනුවෙන් කරනු ලබන මාසික ගෙවීම් ආදිය සඳහා යන බරපැන පියවා ගැනීම සඳහා රු. 5,000 /- ක මුදල් සාමාජිකත්වය පිරිනැමුවාට පසුව එවිය යුතුය. (එය ඇතුළත්වීමේ ගාස්තුව රු. 4,000 /- හා වසර දෙකක සාමාජික ගාස්තු රු. 500 /- X 2 වශයෙනි). මෙම බරපැන ගෙවීමට නොහැකි ඉතා අඩු ආදායම් ලබන පවුල්වල අය සඳහා තම ආදායම තහවුරු කළ හැකි ලිපි ලේඛන සහ තම විහාරස්ථානයේ නායක ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ නිර්දේශය සහිත ග්‍රාම නිලධාරිතුමා මගින් විධායක කමිටුව වෙත සාමාජික ගාස්තු ඉවත් කිරීම සඳහා කරනු ලබන ඉල්ලුම් සලකා බලනු ඇත. සාමාජික ගාස්තු ගෙවීම, ඔබ තෝරාගත් බව දැන්වූවාට පසුව පමණක් සිදු කළ යුතුය. (දිනය පසුව දැනුම් දෙනු ලැබේ) කාර්යාලය අගහරුවාදා, බදාදා හැර සතියේ ඉතිරි දිනයන්හි සෙනසුරාදා, ඉරිදා ඇතුලුව සතියේ දින 5 ක් විවෘතව පවතී. අයදුම් කරන සෑම කෙනෙක්ම තෝරා නොගන්නා අතර එසේ තෝරා නොගැනීමට හේතුව දැනගැනීමට අවශ්‍යනම් අයදුම්පත් විමර්ශනය සඳහා වන ඇතුලත්වීමේ ගාස්තු ගෙවිය යුතු වන්නේය. නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත් ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් සහ 9X4 ප්‍රමාණයේ නම, ලිපිනය ලියූ මුද්දර කවර 2 ක් සමඟ පහත සඳහන් ලිපිනයට තැපැල් මගින් යොමු කරන්න. (අයදුම්පත සමඟ කිසිදු මුදලක් හෝ චෙක් පතක් නොඑවන ලෙස කරුණාවෙන් දැනුම්දෙනු ලැබේ.)

**ගරු ලේකම්, මෙත්සවිය, අංක 55, ශ්‍රී ලංකාරාම විහාරස්ථානය, ලෙස්ලි රණගල මාවත, බොරැල්ල, කොළඹ 08. දුරකථන : 0112 505088, 0714 014467**

**සියළු සාමාජිකයින් සඳහා නොමිලේ පැවැත්වෙන ආධ්‍යාත්මය දියුණු කිරීමේ චිත්ත සංයම අභ්‍යාස හා භාවනා වැඩසටහන් වලට අමතරව ධර්ම දේශනා, විශේෂ දේශන, සාර්ථකව ඉගෙන ගන්නා අන්දම පිළිබඳ වැඩමුළුව, අක්ෂි සායන, වෛද්‍ය සායන වලට සහභාගී වීමට අවස්ථාව සහ පුස්තකාල පහසුකම් හිමිය. මෙත් සවිය සඟරාව නිවසටම තැපෑලෙන් එවන අතර වාර්ෂික දින දර්ශනය ද නොමිලේ මෙත් සවිය මගින් ලබා දේ. මියගිය සාමාජිකයින් සඳහා වාර්ෂිකව සංඝගත දක්ෂිණාවක් පවත්වා පිං අනුමෝදන් කිරීම ද සිදු කෙරේ.**

# මෙත් සවිය

2022 අගෝස්තු මස

## සඟරාව මුද්‍රණය සඳහා බැතිබර දායකත්වය



**2018.11.23 වන දින පරලෝ සැපත්**

මෙත් සවිය සාමාජිකා
20-3278

# සවිත්‍රි වික්‍රමසිංහ

## මහත්මියට පිං පිණිස



**මෙම සඟරාවේ මුද්‍රණ පිරිවැය සඳහා පවුලේ සාමාජිකයින් විසින් දායකත්වය ලබා දී ඇත.**

ඇය ජීවත්ව සිටියදී

11-03-2018 මංහියංගනයේ ඉදිවන බුද්ධ ප්‍රතිමාවහන්සේ සඳහාරු 100,000/- පරිත්‍යාග කරන ලදී
11-08-2018 බුද්ධ ප්‍රතිමාවේ තැන්පත් කිරීම සඳහා රු 100,000/- වටිනාකමින් යුත් තමන් සතු රන් ආභරණ වලින් නිමකරන ලද පෙනහැල්ල ආකෘතියක් පූජා කරන ලදී

පසුව

2019 ජුනි 16 වන කාණ්ඩය 34 කලාපය,මෙත් සවිය සඟරාවේ මුද්‍රණ කටයුතු සඳහා රු 80,000/- පරිත්‍යාග කරන ලදී
05-01-2020 මංහියංගනයේ ඉදිවන බුද්ධ ප්‍රතිමාවහන්සේ සඳහා රු 100,000/- පරිත්‍යාග කරන ලදී
30-12-2020 කළුතර 'සිරි සදහම් ආරාමය' ඉදි කිරීමේ කටයුතු සඳහා රු 100,000/- පරිත්‍යාග කරන ලදී
20-03-2020 කැපකරු ක්‍රමය සඳහා රු 18,000/- පරිත්‍යාග කරන ලදී
2022 අගෝ. 19 වන කාණ්ඩය 38 කලාපය, මෙත් සවිය සඟරාවේ මුද්‍රණ කටයුතු සඳහා රු 70,000/- පරිත්‍යාග කරන ලදී

**ඇය විසින් එක් රැස් කරගන්තා වූ සියළු කුසල් උතුම් වූ නිර්වාණාවබෝධය පිණිසම හේතු වාසනා වේවා යි මෙත් සවිය සියළු දෙනා විසින් පුණ්‍යානුමෝදනා කර සිටිමු.**

## කළුතර මෙත්සවිය පෙර පාසලේ 2022 වෙසක් සහ පොසොන් පොහොය වෙනුවෙන් සිදු කරනු ලැබූ සීල සමාදන් වැඩසටහන්



## කළුතර මෙත්සවිය පෙර පාසලේ දරු දැරියන් හට ශිෂ්‍යත්ව ලබා දීම හා වසරක් අවසානයේ කළ ප්‍රාසාංගික වැඩසටහන ( 2022/04/02 )



# කොළඹ ගංගාරාම විහාරස්ථානයේ

## 2022 ජනවාරි 1 වන දින වසරේ පළමු හීල්දානමය පිංකම

සෑම වර්ෂයකම සිදුකරන වසරේ ප්‍රථම හීල් දානමය පිංකම මෙත්සවිය කාන්තා කමිටුවේ සංවිධාන ශක්තියෙන් හුණුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී සිදු කරන ලදී.





011 2827044 / 0712 285 680